(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 243.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2018 මාර්තු මස 07 වැනි බදාදා අ.භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

138/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා විගණන සේවා ව්‍යවස්ථාව සකස් කිරීමට පත් කරන ලද විද්වත් කමිටුවේ සාමාජිකයන් කවුරුන්ද;

(ii) එම කමිටුව පත් කළ දිනය කවරේද;

(iii) එම කමිටුව මෙම ව්‍යවස්ථාව සකස් කර අවසන් කළ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා විගණන සේවා ව්‍යවස්ථාව සම්මත කිරීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, ඒ කවර දිනයකදීද;

(iii) නොඑසේ නම්, විගණන සේවා ව්‍යවස්ථාව සම්මත කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ කවර දිනයකදීද;

(v) මෙම සේවා ව්‍යවස්ථාව සම්මත කිරීම ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1199/’16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) කිලිනොච්චිය දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට තිබූ,

(i) වාරිමාර්ග සංඛ්‍යාව;

(ii) කුඩා වැව්, අමුණු සහ ඇළ මාර්ග සංඛ්‍යාව;

(iii) අස්වද්දන ලද ගොවිබිම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1983 සිට 2009 වර්ෂයේ යුද්ධමය තත්ත්වය නිම වනතෙක් වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කරන ලද මුදල;

(ii) යුද්ධමය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා, සමස්ත වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණයට රජය විසින් වෙන් කරන ලද මුදල;

එක් එක් වර්ෂය අනුව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1402/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 අයවැයෙහි අංක 169 යෝජනාවට අනුව, කුරුඳු හා ඒ ආශ්‍රිත පර්යේෂණ සඳහා වෙන් කරන ලද රුපියල් මිලියන 5ක ප්‍රතිපාදනය වැය කළ ආකාරය පිළිබඳ වැය විස්තරයක් ඉදිරිපත් කරන්නේද;

(ii) උක්ත අයවැය යෝජනාවට අනුව, 2016 වර්ෂය තුළදී රාජ්‍ය මුල්‍ය ප්‍රතිපාදන භාවිතා කර සිදු කරන ලද පර්යේෂණ සංඛ්‍යාව, එම පර්යේෂණ සිදුකළ පර්යේෂකයන්ගේ නම් සහ ඒවායේ කාර්ය සාධන වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iii) කුළුබඩු (ගම්මිරිස්, කරාබු නැටි සහ සාදික්කා) අපනයන සඳහා වූ සෙස් බදු ඉවත් කිරීම හේතුවෙන් 2016 වර්ෂයේදී සෙස් බදු ආදායම් අහිමිවීමේ ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1508/'17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2016.12.31 දිනට සමස්ත කොටස් මිල දර්ශකයේ අගය කවරේද;

(ii) 2014.12.31 සහ 2015.12.31 දිනට සාපේක්ෂව, 2016.12.31 දිනට සමස්ත කොටස් මිල දර්ශකයේ අගය කොපමණ ප්‍රතිශතයකින් වෙනස් වී තිබේද;

(iii) 2016 වර්ෂය තුළදී ශුද්ධ විදේශීය මිලදී ගැනීම්වල අගය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1639/'17

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) නෝබල් රිසෝසස් ලිමිටඩ් නමැති සමාගම විසින් ලංකා විදුලිබල මණ්ඩලය වෙත වරින් වර සපයා ඇති මුළු ගල් අඟුරු ප්‍රමාණය කොපමණද;

(ii) එම ගල් අඟුරු වෙනුවෙන් ඉහත සමාගමට ගෙවා ඇති සම්පූර්ණ මුදල කොපමණද;

(iii) එම සමාගම විසින් නිසි වෙලාවට ගල් අඟුරු සැපයීමට අසමත් වීම හේතුවෙන් නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ ක්‍රියාකාරිත්වය අත්හිටුවීමට සිදු වූ කාලය කොපමණද;

(iv) එසේ විදුලි ජනක යන්ත්‍ර අත්හිටුවීම නිසා ලංකා විදුලිබල මණ්ඩලයට සිදුවී ඇති පාඩුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නෝබල් රිසෝසස් ලිමිටඩ් ආයතනය විසින් ලබාගෙන ඇති අංක LCC/09/T/02, LCC/01 සහ LCC/13/T/01 දරන ටෙන්ඩරවලට අදාළව ශ්‍රී ලංකාවේ දේශීය නියෝජිතයන් වෙන් වෙන් වශයෙන් කවුරුන්ද;

(ii) ප්‍රසම්පාදන කාර්යය පටිපාටිය නොතකා ඉහත කී ගල් අඟුරු සැපයීම් එකී සමාගමට ලබාදීමට හේතුව කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1648/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රත්මලාන වෘත්තීය පුහුණු විශ්වවිද්‍යාලයේ දැනට ක්‍රියාත්මක වන පීඨ සහ දෙපාර්තමේන්තු කවරේද;

(ii) එම එක් එක් පීඨය මඟින් පවත්වනු ලබන වෘත්තීය පුහුණු පාඨමාලා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) දැනට මෙහි සේවයේ නියුතු අධ්‍යයන හා අනධ්‍යයන සේවක සංඛ්‍යාව, එක් එක් දෙපාර්තමේන්තුව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මෙම විශ්වවිද්‍යාලයේ පවතින සේවක පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1669/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වයඹ පළාත් සභාව යටතේ පුත්තලම දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන විසින් අපද්‍රව්‍ය සහ කැළිකසළ බැහැර කරන ස්ථාන කවරේද;

(ii) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ව්‍යාපෘතියක් මෙම පළාත් පාලන ආයතන සඳහා හඳුන්වා දී තිබේද;

(iii) එසේ නම්, 2010 වර්ෂයේ සිට මේ දක්වා එම ව්‍යාපෘතිය සඳහා එක් එක් පළාත් පාලන ආයතනයකට ලබා දී ඇති පහසුකම් හා මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1690/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2000.05.05 දිනැති අංක 1130/22 දරන ගැසට් නිවේදනය මඟින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ, කොන්දේසි සහිතව නකල්ස් කඳු වැටිය සඳහා ලෝක උරුම තත්ත්වය ලැබුණු බවත්;

(ii) ඉහත කොන්දේසිවල ප්‍රධාන කොන්දේසිය ප්‍රකාරව, නකල්ස් කඳුවැටියට ඉතා ආසන්නව පිහිටි මිනිපේ, පන්විල, පාතදුම්බර, ලග්ගල, විල්ගමුව, රත්තොට, උකුවෙල හා මාතලේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 8ට අයත් අක්කර 2000ක විශාලත්වයෙන් යුත් භූමි ප්‍රමාණයක් උක්ත කඳුවැටිය සමඟ ඒකාබද්ධ කර නොමැති බවත්;

(iii) එබැවින්, නකල්ස් කඳුවැටිය ලෝක උරුම තත්ත්වයෙන් ඉවත්කිරීමේ අවදානමකට ලක්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) නකල්ස් කඳුවැටිය ලෝක උරුම තත්ත්වයෙන් ඉවත්කිරීම වළක්වා ගැනීම සඳහා ඉහත සඳහන් අක්කර 2000ක භූමි ප්‍රමාණය නකල්ස් කඳු වැටිය සමඟ ඒකාබද්ධ කිරීම සඳහා පියවර ගන්නේද;

(ii) එසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1695/'17

ගරු මොහොමඩ් නවවි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2013 වර්ෂයේදී පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය ප්‍රාදේශීය සභාව, නොරොච්චෝලෙයි ගම්මානය තුළ ළමා උද්‍යානයක් පිහිටුවීමට අනුමතිය ලබා දී තිබේද;

(ii) එසේ නම්, එබඳු ළමා උද්‍යානයක් පිහිටුවා තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම කාර්යය සඳහා කොපමණ මුදලක් ලැබී තිබේද;

(ii) එම මුදල් ලැබී ඇත්තේ කා වෙතද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1697/'17

ගරු බිමල් රත්නායක මහතා,— විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ "ගූගල් ලූන්" ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ගූගල් සමාගම හා ශ්‍රී ලංකා රජය අතර ඇතිකර ගත් ගිවිසුමක් හෝ එකඟතා ලියවිල්ලක් තිබේද;

(ii) මේ සඳහා ගූගල් සමාගම තෝරා ගැනීමට රජය තීරණය කළ පදනම කවරේද;

(iii) එම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රජය ලබාදීමට එකඟ වූ හා ලබාදුන් පහසුකම් කවරේද;

(iv) එම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රජයට වැය වූ මුදල කොපමණද;

(v) ගූගල් සමාගම ගුවන්ගත කළ බැලූනය කඩා වැටීමට බලපෑ හේතුව කවරේද;

(vi) ඒ පිළිබඳ පරීක්ෂණයක් සිදුකර වාර්තාවක් නිකුත් කර තිබේද;

(vii) ගූගල් සමාගම මෙම ව්‍යාපෘතිය අතහැර ඇති බවට ප්‍රකාශ කර තිබේද;

(viii) එසේ නම්, අදාළ ගිවිසුම හා එකඟතා කඩවීම හේතුවෙන් ඇති වූ මූල්‍යමය හා අනිකුත් හානි කවරේද;

(ix) එම හානිවල වගකීම පැවරෙන්නේ කාහටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1732/'17

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) උතුරු හා නැගෙනහිර පළාත් තුළ පිහිටි එක් එක් අධ්‍යාපන කලාපයට අයත් මුස්ලිම් පාසල් සංඛ්‍යාව කවරේද;

(ii) ඉස්ලාම්, ඉස්ලාම් අධ්‍යයනය සහ අරාබි ඉගැන්වීම් කටයුතු අධීක්ෂණය සිදු කරන සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ (ඉස්ලාම්) නම් කවරේද;

(iii) සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් (ඉස්ලාම්) නොමැති අධ්‍යාපන කලාපවල නම් කවරේද;

(iv) මෙම කලාපවල ඉහත කී විෂයයන් ඉගැන්වීම අධීක්ෂණය කිරීමේ කාර්යය පවරනු ලැබ ඇති අධීක්ෂකවරුන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය (විශේෂ කාණ්ඩය - ඉස්ලාම්) සඳහා පුරප්පාඩු දෙකක් පමණක් ගැසට් නිවේදනය තුළ පළ කරන ලද බවත්;

(ii) විෂයමාලාව තුළ ආගමික අධ්‍යාපනය අනිවාර්ය බවත්;

(iii) ඉස්ලාම් ඉගැන්වීම් කටයුතු අධීක්ෂණය නොකිරීම, මුස්ලිම් ශිෂ්‍යයන්ගේ ආගමික අධ්‍යාපනය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයෙහි (විශේෂ කාණ්ඩය - ඉස්ලාම්) සේවක සංඛ්‍යාව වැඩි කිරීමට පියවර ගනු ලබන්නේද;

(ii) නොඑසේ නම්, වැඩබලන පදනම මත සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් (ඉස්ලාම්) පත් කිරීමට පියවර ගනු ලබන්නේද;

(iii) එසේ නම්, එය සිදු කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1743/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බන්ධනාගාර නියාමක තනතුරු සඳහා බඳවා ගැනීමට බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේ සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වූ බව දන්නේද;

(ii) එසේ නම්, 2016.10.19 සිට 2016.10.27දක්වා පැවැත්වූ සම්මුඛ පරීක්ෂණ සහ 2016.11.03 සිට 2016.11.12 දක්වා පවත්වන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත අදාළ තනතුරු සඳහා තෝරාගන්නා ලද අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම තනතුරු සඳහා බඳවා ගැනීම් කර ඇති බව හා අදාළ ගිවිසුම් 2016.11.24 දින අත්සන් කරන ලෙස සුදුසුකම්ලාභීන්ට බන්ධනාගාර දෙපාර්තමේන්තුව මඟින් දැනුම් දී නැවත එය කල් දැමුවේ මන්ද;

(iv) එසේ කල් දැමූ පත්වීම් මේ වනවිටත් ලබා නොදීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පත්වීම් ලබා දීමේ ගැටලු සහගත තත්ත්වයක් තිබියදී, පත්වීම්ලාභීන් අපහසුතාවයට පත්වන අයුරින් ඔවුන්ට ගිවිසුම් ලිපි ලබා දුන්නේ මන්ද;

(ii) සුදුසුකම් සපුරන ලද පත්වීම්ලාභීන්ට පත්වීම් ලබා නොදීමෙන් ඔවුන් දැඩි අපහසුතාවයකට පත්ව සිටින බව පිළිගන්නේද;

(iii) එසේ නම්, පත්වීම් නැවත ලබාදීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1750/'17

ගරු ලකී ජයවර්ධන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ මේ වනවිට පවත්වාගෙන යනු ලබන රූපවාහිනී නාලිකා සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් රූපවාහිනී නාලිකාව පවත්වාගෙන යනු ලබන ආයතනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එක් එක් රූපවාහිනී නාලිකාවල හිමිකරුවන් සහ ඒවා ආරම්භ කර ඇති දිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ ආරම්භ කර ඇති රූපවාහිනී නාලිකාවලින් දැනට විකාශනය පවත්වාගෙන නොයන නාලිකා තිබේද;

(ii) එසේ නම්, එම නාලිකා කවරේද;

(iii) රූපවාහිනී නාලිකා නියාමනය සිදු කරනු ලබන්නේ කවුරුන් විසින්ද;

(iv) එම නියාමනය නිසි අයුරින් ක්‍රියාත්මක නොවන බව පිළිගන්නේද;

(v) ද්වේශ සහගතව හා උපහාසාත්මකව යම් යම් නාලිකා මඟින් සිදු කරන බරපතල සමාජ හානි වැළැක්වීම සඳහා රූපවාහිනී නාලිකා නියාමනය කිරීමට කඩිනමින් විධිමත් ක්‍රමවේදයක් සකස් කරන්නේද;

(vi) එසේ නම්, ඒ කෙසේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1842/'17

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය,— රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ, ඔඩ්ඩිසුඩ්ඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති උළු කර්මාන්තශාලාව ක්‍රියාත්මක නොවන බව දන්නේද;

(ii) මෙම කර්මාන්තශාලාව සඳහා 2016 වර්ෂයේ අයවැයෙන් වෙන් කළ මුදල් ප්‍රතිපාදනය කොපමණද;

(iii) එම මුදල වියදම් කරනු ලැබුවේ කවුරුන් හරහාද;

(iv) එම වෙන් කරන ලද මුදලින් සිදු කරන ලද කාර්යයන් පිළිබඳ තොරතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1879/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015.01.08 දින සිට මේ දක්වා කැබිනට් අමාත්‍යවරයන්, රාජ්‍ය අමාත්‍යවරයන් හා නියෝජ්‍ය අමාත්‍යවරයන් සඳහා වාහන මිලදී ගත් අවස්ථා කවරේද;

(ii) එක් එක් වාහනයේ වර්ගය හා මිල කවරේද;

(iii) එම වාහන සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2017 දෙසැම්බර් 11) [1].

*2.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2017 දෙසැම්බර් 11) [1].

*3.

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම් සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2018 පෙබරවාරි 19),— "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත සම්බන්ධයෙන් 2017 නොවැම්බර් මස 07 වැනි අඟහරුවාදා පිළිගන්වන ලද ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව සලකා බැලීම." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*5.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2018 පෙබරවාරි 19),— "පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ චර්යා ධර්ම සම්බන්ධයෙන් 2017 නොවැම්බර් මස 07 වැනි අඟහරුවාදා පිළිගන්වන ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයේ අවසන් කෙටුම්පත අනුමත කළ යුතුය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*6.

සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝග,— 2006 අංක 11 දරන මුදල් පනතේ 8 වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 6 (2) වගන්තිය යටතේ ටෙලිනාට්‍ය, චිත්‍රපට සහ වාණිජ වැඩසටහන් බද්ද සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2017 නොවැම්බර් 07 දිනැති අංක 2044/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.01.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය සමඟ කියවිය යුතු 2, 12, 22 සහ 25 වගන්ති යටතේ පානීය නොවන ස්ප්‍රීතු ආනයනය සඳහා වූ සුරාබද්ද සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2017 දෙසැම්බර් 19 දිනැති අංක 2050/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.02.19 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 1005 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා,— වෙළඳ නැව් පනත යටතේ නියෝග,— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 44 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 321 වගන්තිය යටතේ 2017 වෙළඳ නැව් (කුඩා වාණිජ යාත්‍රා) නියෝග සම්බන්ධයෙන් වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මැයි 04 දිනැති 2017/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.01.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අග්‍රාමාත්‍යතුමා, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා,— ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ සහ උප සභාපතිවරයාගේ පාරිශ්‍රමික හා කොමිෂන් සභා සාමාජිකයන්ගේ දීමනා ප්‍රතිශෝධනය කිරීම,— 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතින් ස්ථාපිත මෙම කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික හා දීමනා එකී පනතේ 4 (8) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු හෙයින්ද;

2017.11.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පදනම් කර ගනිමින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ සහ උප සභාපතිවරයාගේ පාරිශ්‍රමික සහ කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා පහත පරිදි ප්‍රතිශෝධනය කිරීමට අනුමතිය ලබා දී ඇති හෙයින් ද;

(i) කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ උප සභාපතිවරයාට පිළිවෙළින් රු. 75,000/-ක් සහ රු. 60,000/-ක් වශයෙන් මාසික පාරිශ්‍රමිකයන් ගෙවීමටත්;

(ii) කොමිෂන් සභාවේ සාමාජිකයන්ට එක් රැස්වීම් වාරයක් සඳහා රු. 6,000/-ක දීමනාවක් ගෙවීමටත්;

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 13/2008 (iv)හි විධිවිධාන පරිදි සභාපතිවරයා සඳහා ලීටර් 225ක මිලට සමාන මාසික ඉන්ධන දීමනාවක් සහ උප සභාපතිවරයා සඳහා ලීටර් 170ක මිලට සමාන මාසික ඉන්ධන දීමනාවක් ලබා දීමටත්;

ඊට අනුකූලව, 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 4(8) වගන්තිය ප්‍රකාරව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයාට, උප සභාපතිවරයාට සහ සාමාජිකයන් වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් පාරිශ්‍රමික හා දීමනා ගෙවනු ලැබීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අග්‍රාමාත්‍යතුමා, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතියට යටත්ව 2015.11.27 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි එච්. එම්. ගාමිණී විජේසිංහ මහතා විගණකාධිපතිවරයා වශයෙන් පත්කර ඇති හෙයින්ද;

විගණකාධිපතිවරයාගේ වැටුප ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 (2) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන හෙයින්ද;

ජනාධිපතිවරයා විසින් 2017.11.14 වැනි දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව 2017.12.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විගණකාධිපති, එච්. එම්. ගාමිණී විජේසිංහ මහතාට පහත පරිදි වැටුප් හා දීමනා ගෙවීමට අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) 2015.11.27 වැනි දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 අනුව SL - 4 වැටුප් පරිමාණයේ 08 වැනි වැටුප් පියවරේ පිහිටුවා වැටුප් ගෙවීම හා තනතුරට හිමි අනෙකුත් දීමනා ගෙවීමට;

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 අනුව 2016.01.01 වැනි දින සිට වැටුප පරිවර්තනය කිරීමේ දී SL – 4 වැටුප් ක්‍රමය යටතේ එම චක්‍රලේඛයේ උපදෙස් පරිදි වැටුප් පරිවර්තනය කර ගෙවීමට; සහ

(ඇ) එකී වැටුප් පරිමාණයට අදාළ වාර්ෂික වැටුප් වර්ධක ගෙවීමට.

ඊට අනුකූලව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 (2) ව්‍යවස්ථාව ප්‍රකාරව, විගණකාධිපති, එච්. එම්. ගාමිණී විජේසිංහ මහතා වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීම කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

*12.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 27 දිනැති අංක 2047/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.01.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

අග්‍රාමාත්‍යතුමා, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා,— විදේශ විනිමය පනත යටතේ නියෝග,— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 17 දිනැති අංක 2045/56 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.02.19 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

අග්‍රාමාත්‍යතුමා, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා,— අග්‍රවිනිශ්චයකාරවරයාගේ සහ උපරිමාධිකරණ විනිශ්චයකාරවරයන්ගේ වැටුප් හා දීමනා ප්‍රතිශෝධනය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය,— දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්ගේ ද අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්ගේ ද වැටුප් පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන හෙයින්ද;

ජනාධිපතිවරයා විසින් 2018.02.17 වැනි දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව 2018.02.20 දිනැති අමාත්‍ය මණ්ඩලයේ තීරණය අනුව අග්‍රවිනිශ්චයකාරවරයාගේ සහ උපරිමාධිකරණ විනිශ්චයකාරවරයන්ගේ වැටුප් හා දීමනා 2018.01.01 දින සිට පහත පරිදි ප්‍රතිශෝධනය කිරීමට අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 3/2017හි දක්වා ඇති අග්‍රවිනිශ්චයකාරවරයාගේ, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයන්ගේ, අභියාචනාධිකරණයේ සභාපතිවරයාගේ සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්ගේ වැටුප්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් පිළියෙළ කර ඇමුණුම් අංක I ලෙස ඉදිරිපත් කර ඇති ලේඛනයේ සඳහන් පරිදි 2018.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රතිශෝධනය කිරීම සහ වැටුප් පරිවර්තනය පියවරෙන් පියවර පදනම මත සිදු කිරීම;

(ආ) මෙතෙක් වැටුපෙන් 25% ක් වශයෙන් ගෙවනු ලැබූ විශ්‍රාම වැටුප් සහිත දීමනාව 2018.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 50% දක්වා වැඩි කිරීමත්, එම දීමනාව නව වැටුප අනුව ලබන වැටුප් පියවර පදනම් කර ගණනය කිරීම; සහ

(ඇ) මසකට රු.15,000/- ක් වශයෙන් ගෙවනු ලැබූ විශ්‍රාම වැටුප් රහිත විශේෂ දීමනාව වෙනුවට, මසකට රු. 150,000/- ක විශ්‍රාම වැටුපට ගණන් ගැනෙන වෘත්තීය දීමනාවක් ගෙවීම.

ඊට අනුකූලව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව අග්‍රවිනිශ්චයකාරවරයාගේ සහ උපරිමාධිකරණ විනිශ්චයකාරවරයන්ගේ වැටුප් හා දීමනා ඉහත සඳහන් පරිදි ප්‍රතිශෝධනය කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි.

ඇමුණුම I

**ගරු අග්‍රවිනිශ්චයකාරවරයා හා උපරිමාධිකරණ විනිසුරුවරුන් සඳහා 2018.01.01 දින සිට අදාළ කරගත යුතු වැටුප් පරිමාණයන්**

| සේවා ශ්‍රේණිය | | | අභියාචනාධිකරණ විනිසුරුවරුන් | ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්/ අභියාචනාධිකරණයේ සභාපති | අග්‍රවිනිසුරු |
|---|---|---|---|---|---|
| Service Category | | | Appeal Court Judges | Pulsne Judges/ President CA | Chief Justice |
| වැටුප් කේත අංකය | | | ජේ.එස්. 3 - 2016 | ජේ.එස්. 4 - 2016 | ජේ.එස්. 5 - 2016 |
| Salary Code | | | JS 3-2016 | JS 4-2016 | JS 5-2016 |
| 1 | 2 | 3 | 4 | 4 | 4 |
| | | | 6,750 | 7,000 | 7,500 |
| | | | 5 | 5 | 5 |
| | | | | | |
| | | | | | |
| 1 | | | 135,000 | 140,000 | 150,000 |
| 2 | | | 141,750 | 147,000 | 157,500 |
| 3 | | | 148,500 | 154,000 | 165,000 |
| 4 | | | 155,250 | 161,000 | 172,500 |
| 5 | | | 162,000 | 168,000 | 180,000 |
| 6 | | | 168,750 | 175,000 | 187,500 |

* මෙතෙක් වැටුපෙන් 25% ක් වශයෙන් ගෙවනු ලැබූ විශ්‍රාම වැටුප් සහිත දීමනාව 2018.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 50% දක්වා වැඩි කිරීමත්, එම දීමනාව නව වැටුප අනුව ලබන වැටුප් පියවර පදනම් කොට ගණනය කිරීම.

** මසකට රු.15,000/- ක් වශයෙන් ගෙවනු ලැබූ විශ්‍රාම වැටුප් රහිත විශේෂ දීමනාව වෙනුවට රු.150,000 ක විශ්‍රාම වැටුපට ගණන් ගැනෙන වෘත්තීය දීමනාවක් ගෙවීම.

*15.

අග්‍රාමාත්‍යතුමා, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා,— හයිඩ්‍රොෆ්ලෝරොකාබන් (Hydroflurocarbons – HFC) අදියර ගතව සීමා කිරීම පිළිබඳ මොන්ට්‍රියල් සන්ධානය සිදු කළ කිගාලි සංශෝධනය සඳහා ශ්‍රී ලංකාව අනුගත වීම සඳහා යෝජනා සම්මතය,— ගෝලීය උණුසුම අවම කිරීම පිණිස මොන්ට්‍රියල් සන්ධානය විසින් 1990 දී ලන්ඩන් සංශෝධනය, 1992 කෝපන්හේගන් සංශෝධනය, 1997 මොන්ට්‍රියල් සංශෝධනය, 1999 බීජිං සංශෝධනය ලෙස විවිධ ඉලක්ක සපුරා ගැනීමට සංශෝධන අවස්ථා හතරක දී හඳුන්වා දී ඇති අතර ශ්‍රී ලංකාව නියමිත කාල වකවානුවල එම සංශෝධනයන්ට අනුකූලතාවය දක්වා ඇති හෙයින්ද;

2016 වර්ෂයේ සංශෝධනය ලෙස කිගාලි සංශෝධනය හඳුන්වා දී ඇති අතර එමගින් 2050 වනවිට කාබන්ඩයොක්සයිඩ් ටොන් බිලියන 100 කට සමාන ගෝලීය උණුසුමට දායක වන ශීතකාරක ප්‍රමාණයක් භාවිතයෙන් ඉවත් කිරීමට හැකියාවක් ලැබෙන බැවින් ගෝලීය උණුසුම සෙන්ටිග්‍රේඩ් අංශක 0.5 කින් වැඩි වීම වළක්වාලීමට අවස්ථාව උදා කරන හෙයින්ද;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33(2)(ඌ) යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ වෙනත් යම් ලිඛිත නීතියකට හෝ විධිවිධාන වලට පටහැනි නොවන්නා වූද ජාත්‍යන්තර නීතිය, චාරිත්‍ර වාරිත්‍ර හෝ භාවිතය අනුව ඉටු කිරීමට ජනාධිපතිවරයාට බලය ලැබී ඇති බැවින් කිගාලි සංශෝධනය සඳහා අනුගත වීමට එකඟතාවය පළ කිරීම ද ජනාධිපතිවරයාගේ පරමාධිකාරය වන හෙයින්ද;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33(අ) ව්‍යවස්ථාව යටතේ මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් තත් කාලයේ බල පවත්නා නීතිය ඇතුළු යම් ලිඛිත නීතියක් යටතේ ද ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය යථා පරිදි ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සම්බන්ධයෙන් ද ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වග කිව යුතු හෙයින්ද;

2017 සැප්තැම්බර් 29 වැනි දින ජනාධිපතිවරයා, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යවරයා ලෙස ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව ගනු ලැබූ 2017 ඔක්තෝබර් මස 10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, මොන්ට්‍රියල් සන්ධානයේ නවතම සංශෝධනය වන කිගාලි සංශෝධනයට අනුගත වීමට අනුමතිය ලැබී ඇති හෙයින්ද;

ඊට අනුකූලව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33(අ) ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයාගේ යෝජනාවක් ලෙස හයිඩ්‍රොෆ්ලෝරොකාබන් අදියර ගතව සීමා කිරීම පිළිබඳ මොන්ට්‍රියල් සන්ධානය සිදු කළ කිගාලි සංශෝධනය සඳහා ශ්‍රී ලංකාව අනුගත වීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

*16.

ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

සුරැකුම්පත් විනිමය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

හාර (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*21.

සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමූහිකරණය කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 1),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 09 දිනැති අංක 2044/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.02.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*24.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 2),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 15 දිනැති අංක 2045/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.02.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*25.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 3),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 15 දිනැති අංක 2045/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.02.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*26.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 4),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 22 දිනැති අංක 2046/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.02.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*27.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 5),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 28 දිනැති අංක 2047/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.02.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*28.

අග්‍රාමාත්‍යතුමා, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5) (අ) ව්‍යවස්ථාව ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් සාදන ලද, 2017 දෙසැම්බර් 04 දිනැති අංක 2048/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදුව, 2018.01.23 දින ඉදිරිපත් කරන ලද ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු, මාධ්‍ය උපමාන අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*29.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග,— 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වගන්තිය සමඟ කියවිය යුතු, 142 වගන්තිය යටතේ 2016 අංක 2 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි (මිල ඉහළ සීමා) නියෝග සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 දෙසැම්බර් 14 දිනැති අංක 2049/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.01.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*30.

අධිකරණ අමාත්‍යතුමිය,— නීති අධ්‍යාපන සභා ආඥාපනත යටතේ රීති,— (276 වැනි අධිකාරය වූ) නීති අධ්‍යාපන සභා ආඥාපනතේ 7 වගන්තිය යටතේ, අධිකරණ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සංස්ථාගත නීති අධ්‍යාපන සභාව විසින් සාදන ලදුව 2017 නොවැම්බර් 28 දිනැති අංක 2047/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.02.20 දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*31.

අධිකරණ අමාත්‍යතුමිය,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 60 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 61 වගන්තිය යටතේ, අග්‍රවිනිශ්චයකාරවරයාගේ එකඟත්වය ඇතිව, අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2017 දෙසැම්බර් 21 දිනැති අංක 2050/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.02.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*32.

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*33.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*34.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*35.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

36.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

37.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

38.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

39.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

40.

මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

41.

ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

42.

ජාත්‍යන්තර කාන්තා සහ ළමා අයිතීන් සුරැකීමේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

43.

ආලෝකා සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

44.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---